# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 924/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 01/06/2024<br>පැය 1750 |

**මාධ්‍ය නිවේදනය**

**පොලිස්පතිතුමාගේ ප්‍රථම නිල විදේශ සංචාරය නිමා කර යළිත් දිවයිනට - පොලිස් මූලස්ථානය.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා සිය ප්‍රථම නිල විදේශ සංචාරය ලෙස, මාලදිවයින් ජනරජයේ පොලිස්පති අලි සුජාවෝ (Ali Shujau) මහතාගේ ආරාධනය පරිදි එරට ජාතික පොලිස් හා නීතිය බලාත්මක කිරීමේ විද්‍යාලයේ (National College of Policing and Law Enforcement) පුහුණුව ලැබූ නිලධාරීන් 163 දෙනෙකු විසිර යාමේ උත්සවයේ විශේෂ ආරාධිතයෙකු ලෙස සහභාගී වීම සඳහා පසුගිය මැයි 28 වන දින දිවයිනෙන් පිටත්ව ගියහ. 2014 වර්ෂයෙන් පසු ශ්‍රී ලංකා පොලිස්පතිවරයෙකු එම රටෙහි නිල සංචාරයකට එක් වීම මෙහි විශේෂත්වය වේ.

මාලදිවයින වෙලානා ජාත්‍යන්තර ගුවන්තොටුපලේදී පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාව මාලදිවයින් පොලිස් නියෝජ්‍ය කොමසාරිස් ෆර්හාඩ් ෆික්රේ (Farhad Fikry) මහතා ඇතුළු නිලධාරීන් විසින් මහත් හරසරින් පිළිගන්නා ලදී. අනතුරුව මාලදිවයින් පොලිස් මූලස්ථානයේදී පොලිස්පතිතුමන් මාලදිවයින් ජනරජයේ පොලිස්පති අලි සුජාවෝ (Ali Shujau) මහතා හමුවී සුහද පිළිසඳරක නිරත වීමෙන් අනතුරුව දෙපාර්ශවය විසින් සමරු තිළින හුවමාරු කරගන්නා ලදී. අනතුරුව එරට පොලිසිය භාර අභ්‍යන්තර කටයුතු සහ තාක්ෂණ අමාත්‍ය අලි ඉයුසාන් (Ali Ihussan) මහතා සමඟද ද්වපාර්ශවීය සාකච්ඡා පවත්වා අනතුරුව සමරු තිළින හුවමාරුකර ගැනිණි.

මාලදිවයින පොලිස්පතිතුමාගේ ආරාධනය පරිදි 2024 මැයි 29 වන දින උදෑසන ජාතික පොලිස් හා නීතිය බලාත්මක කිරීමේ විද්‍යාලයේ (National College of Policing and Law Enforcement) සංචාරයක නිරත වූ අතර, එහිදී පොලිස්පතිතුමන්ව නිල උත්තමාචාරයකින් පිළිගන්නා ලදී. මෙම සංචාරය සිහිපත් වීම පිණිස එම භූමියේ පොල් පැළයක් රෝපණය කිරීමද පොලිස්පතිතුමා විසින් සිදු කරන ලද අතර, ඉන්පසු එරට

පොලිස්පති සහ එරට උසස් පොලිස් නිලධාරීන් සමග ද්විපාර්ශවික සාකච්ඡා පවත්වා ඇත.

එම සාකච්ඡාවේදී  මත්ද්‍රව්‍ය නිවාරණය, අපරාධ මර්ධනයට අවශ්‍ය තාක්ෂණික සහය ලබාගැනීම සහ දෙරටේ නිලධාරීන් අතර පුහුණු වැඩසටහන් පැවැත්වීම මෙන්ම මත්ද්‍රව්‍ය සහ අපරාධ වැරදි වලට සම්බන්ධ සැකකරුවන් හුවමාරු කර ගැනීම පිළිබඳ විශේෂ අවධානය යොමු කරන ලදී. විශේෂයෙන්ම 2014 සිට 2017 දක්වා මෙවැනි අවබෝධතා ගිවිසුමක් දෙරටේ පොලීසිය අතර ක්‍රියාත්මක වුවත් මේ වන විට එය අහෝසි වී තිබූ බැවින් එම ගිවිසුම නැවත බලාත්මක කිරීම සඳහා  අවධානය යොමු කරන ලදි. ඒ අනුව ඉදිරියේදී මීට අදාල අවබෝධතා ගිවිසුම් දෙරට අතර අත්සන් කිරීමට නියමිතව ඇත.

2024 මැයි 29 වන දින සවස පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා එරට ජාතික පොලිස් හා නීතිය බලාත්මක කිරීමේ විද්‍යාලයේ  (National College of Policing and Law Enforcement) පුහුණුව ලැබූ ආධුනික පොලිස් නිලධාරීන් 163 දෙනෙකු විසිර යාමේ පෙළපාලියේ විශේෂ ආරාධිත අමුත්තෙකු ලෙස එක් වූ අතර එතුමා හට විශේෂ උත්තමාචාරයක්ද මාලදිවයින පොලිසිය විසින් පිරිනමන ලදී.

2024 මැයි මස 30 වන දින ශ්‍රී ලංකා මාලදිවයින් මහ කොමසාරිස්  රංග ගුණවර්ධන මහතා එම කාර්යාලයේදී හමුවී සුහද කථා බහක නිරත වීමෙන් පසු එතුමා විසින් පොලිස්පතිතුමාට සමරු තිළිණයක්ද පිරිනමන ලද අතර ඉන් අනතුරුව මාලදිවයින් සංචාරය නිමා කොට පොලිස්පති දේශබන්දු තෙන්නකොන් මහතා 2024 මැයි 31 වන දින යළිත් දිවයිනට පැමිණෙන ලදි.

මීට අදාල ඡායාරූප




POLICE


POLICE


MINISTRY OF HOMELAND SECURITY AND TECHNOLOGY


MINISTRY OF HOM
ND SECURIT
ND TECHNOLOGY


MINISTRY OF HO
ND SECU
Y AND TECHNOLOGY














BUILDING



**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**